# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 140 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 25/01/2024 පැය 1610

**මාධ්‍ය නිවේදනය**

**මාරක රිය අනතුරක් - ආණමඩුව පොලිස් වසම.**

2024.01.25 වන දින අළුයම් කාලයේ ආණමඩුව පොලිස් වසමේ ආණමඩුව නවගත්තේගම මාර්ගයේ ලබුගල ප්‍රදේශයේදී නවගත්තේගම දෙසසිට ආණමඩුව දෙසට ගමන් කල ලොරි රථයක් කාර්මික දෝෂයක් හේතුවෙන් මාර්ගය අයිනේ නවතා තිබියදී එම දෙසටම ගමන් කල යතුරුපැදියක් ලොරි රථයේ පිටුපස ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ මව, පියා සහ පිරිමි දරුවෙකු ආණමඩුව රෝහලට ඇතුලත් කිරීමේදී පියා සහ පිරිමි දරුවා මියගොස් ඇත.

මරණකරුවන් වයස අවුරුදු 41 ක් හා 10 ක් වූ වෙලේවැව නවගත්තේගම ප්‍රදේශයේ පදිංචි පියා සහ පුතා වේ.

අනතුරින් තුවාල ලැබූ මව පුත්තලම රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත මාරු කර යවා ඇති අතර ලොරි රථයේ රියදුරු ආණමඩුව පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. ආණමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.